# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2163/30 - 2020 පෙබරවාරි මස 20 වැනි බ්‍රහස්පතින්දා - 2020.02.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය*: DIK/LAN/02/30/48.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/පරවශ්‍යතාව ලබාගැනීමට රජය අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවයේ විස්තර:*

මාතර දිස්ත්‍රික්කයේ, දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැල්ලබඩ පත්තුව (නැගෙනහිර) සුළු කොට්ඨාසයේ රත්මලේ ග්‍රාම නිලධාරි වසමෙහි බඹරැන්ද මධ්‍යම සහ බඹරැන්ද දකුණ ගමේ පිහිටි මාතර ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරීගේ අංක මූ.පී. මාර 2812 දරන මූලික පිඹුරේ පෙන්වා ඇති පහත සඳහන් බිම් කොටස්.

01. කැබලි අංකය 01

ඉඩමේ නම: දියැහැලියබොරලැස්ස; විස්තරය: විවෘත මුඩු බිම; හිමිකම් කියන අය: ගොයිගොඩ ගමගේ මංජුලා පත්මකාන්ති, බොරලැස්ස, රත්මලේ, දික්වැල්ල; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0925.

02. කැබලි අංකය 02

ඉඩමේ නම: බොරලැස්ස; විස්තරය: විවෘත මුඩු බිම; හිමිකම් කියන අය: වසන්තා කුමුදිනී සමරසේකර, බොරලැස්ස, රත්මලේ, දික්වැල්ල; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0066.

03. කැබලි අංකය 03

ඉඩමේ නම: දම්පොත; විස්තරය: විවෘත මුඩු බිම; හිමිකම් කියන අය: ආරියවතී වික්‍රමරත්න බණ්ඩාරනායක, බොරලැස්ස, රත්මලේ, දික්වැල්ල; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0242.

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020.03.18 වැනි දින පෙ. ව. 10.30 ට දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තව ද, 2020.03.11 වන දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම්/පරවශ්‍යතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත ලියවිල්ලකින් දැනුම්දිය යුතුය.

සුසන්ත අත්තනායක,
ප්‍රාදේශීය ලේකම්,
දික්වැල්ල.

2020 පෙබරවාරි මස 11 වැනි දින,
දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

03 - 187

සංශෝධනයයි

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*යොමු අංකය* : KDS/UDP/4/1/LAQ/SO'ES.

*ඉඩම් අමාත්‍යාංශයේ අංකය*: 4-3/15/2016/VE/359.

**නායයෑමෙන් අවතැන්වූවන්ට බෙදාදීම සඳහා ඉඩම් අත්පත් කරගැනීම**

ඉහත ශීර්ෂය යටතේ 2020.01.01 දින අංක 2156/19 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ මවිසින් පළකරන ලද දැන්වීමේ සඳහන් සී.එම්.320180 (2) 13 හි කැබලි අංක 102 හා 103 යන ඉඩම් කොටස් අත්කර ගැනීමක් සිදු නොවන බැවින් එම කැබලි දෙක ඉවත් කොට සී.එම්.320180 (2) 13 හි කැබලි අංක 104 සඳහාවන වන්දි පරීක්ෂණය හා වේලාව පහත සඳහන් පරිදි ආදේශ කර එම දැන්වීම සංශෝධනය කරනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

*වන්දි පරීක්ෂණ දිනයන් හා වේලාව :*

| අනු අංකය | කැඩැස්තර සිතියම් අංකය | කැබලි අංකය සහ කැබලි ගණන | | වන්දි පරීක්ෂණ දිනය | වේලාව | ස්ථානය |
|---|---|---|---|---|---|---|
| | | කැබලි අංකය | කැබලි ගණන | | | |
| 01 | සී.එම්. 320180 (2)13 | 104 | 01 | 2020.03.19 | පෙ.ව. 10.00 | ගම්පොල උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |

ආර්. ඒ. ඩී. ටී. එන්. තෙන්නකෝන්,
ප්‍රාදේශීය ලේකම්,
උඩපළාත කොට්ඨාසය,
ගම්පොල.

2020 පෙබරවාරි මස 18 වැනි දින,
උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

03 - 188

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.